සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
**Department of Education - Western Province**

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2017
**Year End Evaluation**

පිළිතුරු පත්‍රය
**Marking Scheme**

ශ්‍රේණිය / தரம் / Grade: 11
විෂයය / பாடம் / Subject: නාට්‍ය හා රංග කලාව
පත්‍රය / வினாத்தாள் / **Paper**: **I,II**

## නාට්‍ය හා රංග කලාව I

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| (1) | 3 | (11) | 3 | (21) | 3 | (31) | 3 |
| (2) | 2 | (12) | 3 | (22) | 2 | (32) | 3 |
| (3) | 3 | (13) | 3 | (23) | 1 | (33) | 4 |
| (4) | 3 | (14) | 3 | (24) | 2 | (34) | 1 |
| (5) | 3 | (15) | 2 | (25) | 3 | (35) | 4 |
| (6) | 2 | (16) | 4 | (26) | 3 | (36) | 3 |
| (7) | 4 | (17) | 3 | (27) | 2 | (37) | 1 |
| (8) | 4 | (18) | 2 | (28) | 4 | (38) | 4 |
| (9) | 4 | (19) | 4 | (29) | 4 | (39) | 2 |
| (10) | 3 | (20) | 2 | (30) | 4 | (40) | 1 |

## නාට්‍ය හා රංග කලාව II

(01) (1) නූතන තරඟකාරී අධ්‍යාපන ක්‍රමය හමුවේ බිඳ වැටෙන යෞවනත්වයේ ඛේදවාචකය මෙහි ප්‍රධාන තේමාව වේ.

(2) විවිධ ගීත නර්තනමය කොටස් යොදා ගැනීම, සංකේතාත්මක පසුතල ශාස්ත්‍රකරුගේ වෙළඳසැල, තාරුණ්‍ය සංකේතවත් කරන නැටුම

(3) සෝමලතා සුබසිංහ මහත්මියගේ පරිකල්පනයෙන් ලියැවුණ පිටපතකින් නිර්මාණය කළ නාට්‍යයක් නිසා

(4) පසුතල හා ඇඳුම් නිර්මාණයෙන්

(5) දහයකට, ක්‍රීඩා උත්සවය

(6) විවෘත ආර්ථිකය හේතුකොටගෙන 80 දශකයෙන් පසුව ශ්‍රී ලංකාවේ සමාජයත් පවුලත් අතර සිදු වන්නාවූ ඝට්ටනය නැතහොත් දැඩි ලෙස වාණිජකරණය වූ සමාජයක යහපත් පුරුෂාර්ථයක් විනාශ වී යන බව පෙන්වා දීම. (ල. 2 × 6 = 12)

(02) (1) රචකයා විසින් රචනා කරන ලද නාට්‍ය පිටපත වේදිකා නිර්මාණයක් (රංගයක්) බවට පත් කිරීමට අධ්‍යක්ෂවරයෙකු අවශ්‍ය වේ. (ල. 03)

(2) නාට්‍ය රචක යනු නාට්‍ය පෙළ රචනා කරන පුද්ගලයාය. අධ්‍යක්ෂවරයා යනු නාට්‍ය පෙළ වේදිකා නිර්මාණයක් බවට පත්කරන තැනැත්තාය. ඒ අනුව රචකයා ලියන්නේ සාහිත්‍යමය

නිර්මාණයකි. අධ්‍යක්ෂකවරයා එය නිෂ්පාදනයක් බවට පත් කරයි. මේ දෙදෙනාගේ කාර්යභාර දෙකකි. (ල. 03)

(3)
- පෙළ තෝරා ගැනීම.
- පෙළ අධ්‍යයනය කිරීම.
- නළුවරණය, ආනුෂාංගික ශිල්පීන් තෝරා ගැනීම.
- පෙළ කියවීම.
- පුහුණුවීම - ආරම්භ කිරීම
- නොනවතින පුහුණුවීම් අංග
- සවේෂ පුහුණුව
- මංගල දර්ශනය (මෙයින් ප්‍රධාන කරුණු 6ක් ඇත්නම් සම්පූර්ණ ලකුණු ලබා දෙන්න.)

(ල. 06)

(03) (1) රංග ක්‍රීඩා යනු නළුවෙක් හෝ නිළියක් රංග කාර්ය පුරුදු පුහුණු වීම සඳහා කරනු ලබන නිර්මාණාත්මක ක්‍රීඩා ය. (ල. 03)

(2)
- දූපත් ක්‍රීඩාව
- ඉරියව් වෙනස්කිරීමේ ක්‍රීඩාව
- අංක ක්‍රීඩාව
- මීයා පූසා
- පලතුරු ක්‍රීඩාව
- බල්ලා සහ මස් කටුව (ල. 04)

(ආදී ක්‍රීඩා හතරක් නම් කර ලියා ඇත්නම් සම්පූර්ණ ලකුණු ලබා දෙන්න.)

(3)
- අවධානය දියුණු කර ගැනීම.
- පරාජය විඳ දරාගැනීම.
- ජයග්‍රහණය ලබා ගැනීමට දිරිමත් වීම.
- ක්‍රියාකාරී බව දියුණු කර ගැනීම.
- සාමූහිකව කටයුතු කිරීමේ හැකියාව දියුණු කිරීම.
- අන්මත ඉවසීම.
- අණට කීකරු වීම.
- ක්ෂණිකව ක්‍රියාත්මක වීම. (කරුණු 5ක් ඇත්නම් ලකුණු 5ක් දෙන්න.)

(04) (1) අංග රචනය යනු නළුවාගේ හෝ නිළියගේ ශරීරයේ වේෂ භූෂණ (ඇඳුම් පැළඳුම්) වලින් නොවැසුණු කොටස් නළු කාර්යය සඳහා සකස් කිරීමයි. හෙවත් රචනා කිරීමයි. (ල. 03)

(2)
- පදනම් ආලේපය
- ලයිනින් කලර්ස්
- මේක් අප් පෙන්සිල්ස්
- ටූත් එනමල්
- බ්‍රෂ් සහ ස්පොන්ච්
- පවුඩර් පෆ්
- නෝස්පොටි
- ක්‍රේප්හෙයා
- ස්ප්‍රීට්ගම්
- රිමුවින් ක්‍රීම් (මෙයින් හතරක් ඇත්නම් සම්පූර්ණ ලකුණු දෙන්න) (ල. 04)

(3)
- අංග රචනය මගින් විවිධ චරිත නිරූපණය කළ හැකිය.
- චරිතවල බාහිර ස්වරූපයන් පමණක් නොව අභ්‍යන්තර චරිත ලක්ෂණ නිරූපණය කිරීම සඳහා ද අංග රචනය බලපායි.

- අංග රචනය මගින් ප්‍රේක්ෂකයාගේ විශ්වාසය දිනාගත හැකිය.
- අංග රචනය මගින් නාට්‍යයේ චරිත ජීවත්වන තත්වයන් මතු කළ හැක.
- රංගාලෝකය මගින් පැතලි වන විට මුහුණේ ත්‍රිමාන බව මතු කිරීම නාට්‍යයේ සාර්ථකත්වයට බලපායි. (ල. 05)

(05) (1) සබය, කරලිය, තානායම්පොල, කමත, අර්ධ කවාකාර රංග භූමිය, වට රවුම් රංග භූමිය, ප්‍රොසීනියම් හෙවත් පින්තූර රාමු වේදිකාව (ල. 03)

(2)

| | | |
|---|---|---|
| 1 | 2 | 3 |
| 4 | 5 | 6 |
| 7 | 8 | 9 |

1. උඩු දකුණු වේදිකාව
2. උඩු මැද වේදිකාව
3. උඩ වම වේදිකාව
4. මැද දකුණු වේදිකාව
5. මැද වේදිකාව
6. මැද වම වේදිකාව
7. යට දකුණු වේදිකාව
8. යට මැද වේදිකාව
9. යට වම වේදිකාව (ල. 04)

(3) රංග භූමියේ ලක්‍ෂණ -

- සමතලා භූමියක් වීම.
- රගපෑමට අවශ්‍ය ප්‍රමාණවත් අවකාශයක් තිබීම.
- රංගන ශිල්පීන් සඳහා අවශ්‍ය පහසුකම් වලින් යුක්ත වීම.
- වැඩි ප්‍රේක්ෂක පිරිසකට පහසුවෙන් නැරඹීමට හැකි වීම.
- පැහැදිලි ආලෝකයකින් යුක්ත වීම.

යන කරුණු 5ක් සඳහා ලකුණු 5යි.

(06) (1) රටයකුම / රිද්දි යාගය (ල. 02)

(2) පහත රට ප්‍රදේශ/ ගාල්ල, මාතර, බෙන්තර, නානුමුරය, දොළහ පෙළපාලිය
කපු උපත / කපු යක්කාරිය - දරු නැලවිල්ල (ල. 04)

(3) අනුකරණය සමාරෝපය, ප්‍රතිනිර්මාණය, අවස්ථා නිරූපණය, සජීවී බව, මුඛරි සංවාද භාවිතය, අනුරූපණය, අභිරූපණය ආදිය නිදසුන් දෙමින් සාකච්ඡා කිරීම සඳහා (ල. 06)

(07) (1) නාට්‍යෝචිත අවස්ථා නිර්මාණය සඳහා (ල. 04)

(2) සංවාද සහ රංග විධාන සහිතව පෙළ රචනා කිරීම (ල. 08)